# ප්‍රසම්පාදන දැන්වීමයි

## අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

## සබරගමුව පළාත් සභාව

**සබරගමුව පළාත් සභාවේ අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පළාත් නිශ්චිත කාර්ය සංවර්ධන ප්‍රදාන වැඩසටහන යටතේ ( PSDG ) කර්මාන්ත 03 ක් , සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන (GEMP) යටතේ කර්මාන්ත 11 ක් , දිට්වා සුළි කුණාටුවෙන් ආපදාවට ලක්වූ පාසල් පුනරුත්ථාපන වැඩසටහන යටතේ (Ditwah) කර්මාන්ත 06 ක් , පාසල් ගොඩනැගිලි නඩත්තු වැඩසටහන ( RECURRENT ) යටතේ කර්මාන්ත 04 ක් සහ වතු පාසල්වල පාසල් ගොඩනැගිලි අළුත්වැඩියාකිරීමේ ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කර්මාන්ත 05 ක් සහ ඉටුකිරීම සඳහා මිළ ගණන් කැඳවීම**

**සියළුම ලංසුකරුවන් වෙත.**

**<u>පූර්ව ලංසු සාකච්ඡා තීරණ දැනුම්දීම - 2026.10.19 දින පෙ.ව.10.30</u>**

*<u>සහභාගීත්වය</u>*

අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ(ක්‍රම සම්පාදන) /,ප්‍රධාන ගණකාධිකාරී ඇතුළු අදාල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පූර්ව ලංසු සාකච්ඡාව ආරම්භ විය.

ලංසු ලබාගැනීමට අපේක්ෂිත/ලංසු ලබාගත් ආයතන තුනක සහභාගීත්වයෙන් මෙම පූර්ව ලංසු සාකච්ඡාව පවත්වන ලදී.

ලංසු ලේඛන සහ ලංසු බැදුම්කරය නිවරදිව සම්පූර්ණකර ඉදිරිපත්කිරීමේ වැදගත්කම, ලංසු බැදුම්කරයේ වලංගු කාලය නිවරදිව සදහන්කිරීම ආදී කරුණු සහ ඉල්ලා ඇති සුදුසුකම් පිළිබද ලේඛන නිවරදිව ලංසුව සමග ඉදිරිපත්කිරීමේ වැදගත්කම පැහැදිලි කරන ලදී.

ලංසුකරුවන් විසින් අදහස් වක්වමින් ඇස්තමේන්තුවල ඇතැම් අයිතමවල රජයේ මිල ගණන් වෙළදපලේ පවතින මිල ගණන්වලට වඩා විශාල වශයෙන් අඩුව පවතින අවස්ථා පිළිබදව විමසන ලද අතර, ඒ ඒ ආයතනය ඉදිරිපත්කරන මිල ගණන් ඇගයීම් කිරීමේදී අසාමාන්‍ය ඉහල මිල ගණන් ඉදිරිපත්කර ඇත්නම් ඒ ආයතනවලින් මිල විශ්ලේෂණ ලබාගෙන ඇගයීම් කරන බව සදහන් කරන ලදී.

මෙම පූර්ව ලංසු සාකච්ඡාවේදී පහත තීරණ ගන්නා ලදී.

01 මෙම ප්‍රසම්පාදන දැන්වීම මගින් ලංසු කැදවා ඇති අධ්‍යාපන,උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ වතු පාසල්වල පාසල් ගොඩනැගිලි අළුත්වැඩියාකිරීමේ ව්‍යාපෘතිය මගින් **ක්‍රියාත්මක කර්මාන්ත 05 ක් ඉටුකිරීම** යටතේ අංක **EDM- Estate School -02** යටතේ සදහන් **ර/නිවි/කොළඹගම දෙමළ විද්‍යාලයේ අංක 03 ගොඩනැගිල්ල අළුත්වැඩියාකිරීම** කර්මාන්තයට අදාලව ලංසු ලේඛන නිකුත් නොකිරීමට තීරණය කිරීම

02.ඉහත සංශෝධනයට යටත්ව අමාත්‍යාංශය දැනට නිකුත්කර ඇති ප්‍රසම්පාදන දැන්වීම අනුව සකස්කර ඇති ලංසු ලේඛන අනුව ඉදිරි ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීමට තීරණය විය.

03.මෙම පූර්ව ලංසු සාකච්ඡා තීරණය සබරගමුව පළාත් සභාවේ <u>www.sg.gov.lk</u> වෙබ් අඩවියතුල ඇති ටෙන්ඩර් දැන්වීම් වෙබ් පිටුව හෝ <u>www.moe.sg.gov.lk</u> යන අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් පිටුව මගින් ලංසුකරුවන්ට ප්‍රසිද්ධ කිරීම.

වෙනත් විශේෂිත කරුණු මෙම ප්‍රසම්පාදන දැන්වීම සම්බන්ධයෙන් ලංසුකරුවන්ගේ පාර්ශවයෙන් ඉදිරිපත් නොවූ බැවින් මෙම පූර්ව ලංසු සාකච්ඡාව පෙ.ව.11.00 ට පමණ අවසන්කරන ලදී.

G.D.Lakmali U.Kumari
Secretary
Ministry of Education , Information Technology & Cultural Affairs
Sab... ...uwa Provincial Council
...town - Ratnap...

ජී.ඩී.ලක්මලී යූ.කුමාරි .
ලේකම්
අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.
2026/10/19